# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,661 - 2010 ජූලි මස 02 වැනි සිකුරාදා - 2010.07.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1292 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1297 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූලි මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජූනි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# තනතුරු - ඇබෑර්තු

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

ශිල්පීය නොවන III ශ්‍රේණියේ තනතුරට සහ අර්ධ ශිල්පීය III ශ්‍රේණියේ තනතුරට බඳවාගැනීම කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ශිල්පීය නොවන III ශ්‍රේණිය තනතුරකට සහ අර්ධ ශිල්පීය 111 ශ්‍රේණිය තනතුරකට බඳවා ගැනීම සඳහා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | | මාසික රා.පරි. ච. 6/2006 (iv) අනුව | |
| 01. | මාර්ග කම්කරු | 01 | රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් 02ක් (දෙකක්) සමත්වීම. |
| 02. | වැඩ පරිපාලක | 01 | රු.12,210-10x130-10x145-10x160 -12x170-රු.18,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් 02ක් (දෙකක්) සමත්වීම. වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන එන්වීකිව් 2 හෝ 3 මට්ටමේ සහතිකයක්, වසර 02කට නොවැඩි සේවා පළපුරුදු පිළිබඳ සහතිකයක් |

03. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :-*

01. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
02. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුන (03)කට නොඅඩු කාලයක් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. (ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරන සහතිකයකින් සනාථ විය යුතු ය.)
03. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට ස්ථිර සේවයේ නියුතු අයට වයස් සීමාව බලපානු නොලැබේ.)
04. දණ්ඩ නීති සංග්‍රහයේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
05. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගිවන අයදුම්කරුවන්ගෙන් අධ්‍යාපන සුදුසුකම් සහ වාචික පරීක්ෂණයක ප්‍රථිපල මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

01. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය.
02. වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.
03. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
03. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව
ගරු වයඹ ආණ්ඩුකාරතුමා විසින් 2008.11.19 වැනි දින හා 2009.12.05 වැනි දින අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද , මුදල් රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කුලියාපිටිය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටිය යුතු ය.

06. *අයදුම්පත ඉදිරිපත් කිරීම : -*

01. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියල කරගන්නා ලද අයදුම්පත 2010.07.23 වැනි දින හෝ එදිනට පෙර ලේකම්, කුලියාපිටිය ප්‍රාදේශීය සභාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

02. අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙලවරේ අදාල තනතුර සඳහන් කර ............... තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කර අයදුම්පත එවිය යුතු ය.

03. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුනා එවිය යුතු ය :-

(අ) උප්පැන්න සහතිකය ;
(ආ) අධ්‍යාපන සහතික ;
(ඇ) අස්වීමේ සහතිකය ;
(ඈ) පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය ;
(ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතු ය.)
(ඉ) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් ;
(ඊ) වෘත්තිය පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම අයදුම්පත් කැඳවීමකින් පසුව හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මා සතු ය.

එච්. ඒ. ජී. නිශ්ශංක,
ලේකම්,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2010 ක් වූ ජූනි මස 03 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව,
කුලියාපිටිය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***කුලියාපිටිය ප්‍රාදේශීය සභාව***

*කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ශිල්පීය නොවන/අර්ධ ශිල්පීය 111 ශ්‍රේණිය තනතුර සඳහා බඳවා ගැනීම - 2010*

*......................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. *අයදුම්කරුගේ නම මුලකුරු සමග* :————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
03. ස්ථිර ලිපිනය :————.
04. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.
05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:————.
06. දිස්ත්‍රික්කය :————.
07. උපන් දිනය : අවුරුද්ද:————, මාසය :————, දිනය :————.
08. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු:————, මාස :————, දින :————.
09. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
10. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද ? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :————.
11. විවාහක / අවිවාහක බව : ————.
12. ජාතික හැඳුනුම්පත් අංකය :————.
13. අධ්‍යාපන සුදුසුකම්:————.
අ.පො.ස. (සා.පෙළ) විභාගය
සමත් වර්ෂය හා විභාග අංකය

| *අනු අංකය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |
| 04. | | |
| 05. | | |
| 06. | | |
| 07. | | |
| 08. | | |

14. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :————.
15. සේවා පළපුරුද්ද :-

(අ) දැනට සේවය කරන ආයතනය :————.
(ආ) දැනට දරන තනතුර :————.

(ඇ) එම තනතුරට පත් වූ දිනය :———.
(ඈ) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :———.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම ඉල්ලුම්කරු වන ............................................ මයා/මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ ....................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත් නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

———,
ආයතන ප්‍රධානියාගේ හෝ බලය
පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

නම :———.
පදවි නාමය :———.
ආයතනය :———.
දිනය :———.

07-11

---

**මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචි අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

| *අනු අංකය* | *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම් හා බඳවාගැනීමේ ක්‍රමය* |
|---|---|---|---|
| 01. | කාර්යාල සේවක සේවය 111 පන්තිය (මාර්ග කම්කරු) | රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 PL-1-2006A | i. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලක අවම වශයෙන් 05/06 ශ්‍රේණිය සමත් විය යුතු ය. |
| 02. | කර්මාන්ත පරිපාලක 11 පන්තිය | රු.13,120-10x145-11x170-10x240 -10x320-රු.22,040 | i. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ගණිතය/වානිජ අංක ගණිතය/ශුද්ධ ගණිතය/ හා සිංහල/ දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම ; හෝ |
| 03. | වැඩ පරිපාලක | MN-1-2006A | ii. ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවකදී ගණිතය හා සිංහල/දෙමළ භාෂාව ඇතුලු විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම ; හෝ |
| | | | iii. පළාත් පාලන ආයතනයක අවුරුදු 10කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 08 පන්තිය සමත් වී තිබීම. රා.ප.ච. 15/90 අනුව ලිඛිත පරීක්ෂණයෙහි ප්‍රතිඵල මත සම්මුඛ පරීක්‍ෂණයකින් තෝරාගනු ලැබේ. ● සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය පැය 1 1/2. ● සාමාන්‍ය දැනුම පැය 01. |
| 04. | ආදායම් පරිපාලක 11 පන්තිය | රු.13,120-10x145-11x170-10x240 -10x320-රු.22,040 | i. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි |

| | | | | |
|---|---|---|---|---|
| | | MN-1-2006A | | වාර ගණනක දී අංක ගණිතය/ශුද්ධ ගණිතය/වානිජ අංක ගණිතය/ගණිතය/හා සිංහල/ දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම හා බස්නාහිර පළාත තුළ පළාත් පාලන ආයතනයක වසර 05ක සේවා කාලයක් සහිත ස්ථිර තනතුරක් දරන්නෙකු වීම ; හෝ |
| | | | ii. | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ශුද්ධ ගණිතය /වානිජ අංක ගණිතය/ගණිතය/හා සිංහල/දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 05කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම.<br><br>රා.ප.ච. 15/90 අනුව ලිඛිත පරීක්ෂණයෙහි ප්‍රතිඵල මත සම්මුඛ පරීක්‍ෂණයකින් තෝරාගනු ලැබේ.<br><br>● සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය පැය 1 1/2<br>● සාමාන්‍ය දැනුම පැය 01 |
| 05. | කාර්යාල සේවක සේවය II පන්තිය (කා.කා.ස.) | රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 (ආරම්භක වැටුප 12 වන පියවර) PL-1-2006A | i. | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී එක් වරක දී කවර හෝ විෂයයන් 06කින් සමත් විය යුතු ය. |
| 06. | කාර්යාල සේවක සේවය III පන්තිය (පුස්තකාල සහායක) | රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 (ආරම්භක වැටුප 12 වන පියවර) PL-1-2006A | i. | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී එක් වරක දී කවර හෝ විෂයයන් 06කින් සමත් විය යුතු ය. |
| 07. | කාර්යාල සේවක සේවය III පන්තිය (ආදාහනාගාර ක්‍රියාකරු සහායක) | රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 PL-1-2006A | i. | අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය /09 වසර සමත් වී තිබිය යුතු ය. |

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.
2. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන්නේ ය.
3. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියාත්මක කිරීමට ද, සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

*බඳවා ගැනීම සඳහා පොදු තොරතුරු :*

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
2. අයදුම්කරු බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු අතර අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් එම පළාත තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
4. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම :-*

1. කර්මාන්ත පරිපාලක ආදායම් පරිපාලක හා වැඩ පරිපාලක තනතුරු සඳහා ලිඛිත පරීක්‍ෂණයේ ප්‍රතිඵල මත සුදුසුකම් පරීක්‍ෂා කිරීමේ සම්මුඛ පරීක්‍ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ. කාර්යාල කාර්ය සේවයේ 111 (මාර්ග කම්කරු) තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් පමණක් සුදුස්සන් තෝරාගනු ලැබේ.

2. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගන්නාලද අයදුම්පත් 2010.07.23 වැනි දිනට පෙර ලැබෙනසේ ලේකම්, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව, උඩුගම්පොල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු ය.

3. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාල තනතුර සඳහන් කර අයදුම්පත් එවිය යුතු ය.

4. එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

5. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය :-

    1. උප්පැන්න සහතිකය ;
    2. අධ්‍යාපන සහතික ;
    3. පදිංචිය තහවුරු කිරීම පිණිස මාස 03ක් ඇතුලත ලබාගත් ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය ;
    4. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි මහතාගෙන් ලබාගත් එකක් විය යුතු ය.)

6. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ අතරතුර දී හෝ බඳවාගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

එන්. කේ. දසනායක,<br>
ලේකම්,<br>
මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2010 ජුනි මස 11 වැනි දින,<br>
මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ දී ය.

මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව

**............................................ *තනතුර සඳහා වූ අයදුම්පත්‍රය***

(අ) මුලකුරු සමඟ නම :——————.<br>
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.

තැපැල් ලිපිනය :——————.

01. දුරකථන අංකය :——————.

02. හැඳුනුම්පත් අංකය :——————.

03. උපන් දිනය : අවුරුද්ද :——————.මාසය :——————.දිනය :——————.

04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :——————.මාස :——————.දින :——————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

06. විවාහක/අවිවාහක බව :——————.

07. ජාතිය :——————.

08. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද ? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි කිරීමෙන් ද? යන වග :——————.

09. අධ්‍යාපන සුදුසුකම් :——————.

10. වෙනත් සුදුසුකම් :——————.

11. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර :——————.

12. පලපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්:——————.

මෙම අයදුම්පතේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

........................................................................................ මහතා/මහත්මිය/මෙනවිය ............................................................ තනතුර දරන සේවක මහත්මයෙකු/මහත්මියක බවත්, ඔහු/ඇය මෙම කාර්යාලයේ සේවයේ යෙදී සිටින බවත්, ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි.

මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් මෙම .................................................... සේවයෙන් මුදාහැරිය හැකි/නොහැකි බවත් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :————.

07-10

---

# පළාත් පාලන නිවේදන

## වරකාපොල ප්‍රාදේශීය සභාව

### විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර වරකාපොල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ (2) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමු පළාතේ ප්‍රධාන පළාත් පාලන අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී උපවගන්තිය අනුව මෙයින් පළ කරනු ලැබේ.

**යෝජනාව**

වරකාපොල ප්‍රාදේශීය සභාව ලෙස අප විසින් සිනමාහල්වලින් අයකරනු ලබන 10%ක විනෝද බදු මුදල 7.5% දක්වා අඩු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. (එම යෝජනාව 2009.10.27 වැනි දින මහා සභාවේ දී තීරණ අංක 07-03 යටතේ සම්මත විය.)

හේරත්. පී. කුලරත්න,
ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය,
සබරගමුව.

07-162

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.* - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2010** | | | |
| ජූලි | 2010.07.02 | සිකුරාදා | 2010.06.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.09 | සිකුරාදා | 2010.06.24 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2010.07.16 | සිකුරාදා | 2010.07.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.23 | සිකුරාදා | 2010.07.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.30 | සිකුරාදා | 2010.07.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2010.08.06 | සිකුරාදා | 2010.07.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.13 | සිකුරාදා | 2010.07.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.20 | සිකුරාදා | 2010.08.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.27 | සිකුරාදා | 2010.08.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2010.09.03 | සිකුරාදා | 2010.08.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.09.09 | බ්‍රහස්පතින්දා | 2010.08.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.09.17 | සිකුරාදා | 2010.09.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.09.24 | සිකුරාදා | 2010.09.09 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.